C
378
PER

# විවිධ ශාස්ත්‍රීය ශික්ෂණයන්ට අයත් උපාධි අපේක්ෂකයන්ගේ ඉගෙනුම් ශෛලීන් පිළිබඳ විමර්ශනයක්

(ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුනක පළමු වසර උපාධි අපේක්ෂකයන් ඇසුරෙන් කරන ලද අධ්‍යයනයක්)

**An Examination of Learning Styles of Undergraduates in Different Academic Disciplines**

(A Study of First Year Undergraduates in Three Sri Lankan Universities.)

ඒ.බී.පී පෙරේරා

(ලි.ප. අංකය : GS/M Phil/94/96/558)

විද්‍යාවේදී ශ්‍රී ලංකා, අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට) ශ්‍රී ලංකා

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යාපන අංශයේ දර්ශනපති (අධ්‍යාපන) දෑ අවුරුදු පර්යේෂණ උපාධි පාඨමාලාවේ අවශ්‍යතා පූරණය කිරීම් සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය.

**1994/96**

නිබන්ධන උපදේශක : මහාචාර්ය එස් ජේ පෙරේරා

අධ්‍යාපන විද්‍යා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

පේරාදෙණිය, ශ්‍රී ලංකාව

523121

# සාරාංශය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ ශාස්ත්‍රීය ශික්ෂණයන්ට අයත් සිසුන්ගේ ඉගෙනුම් ශෛලීන් යම් රටාවකට ව්‍යාප්ත වී තිබේ දැයි විමර්ශණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. එසේම සිසු ඉගෙනුම් ශෛලීන් හා පසුබිම් විය හැකි විචල්‍යයන් කිහිපයක් පිළිබඳව ද විමසීමට ලක් කෙරුණි.

ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල තුනක කලා, ඉංජිනේරු, වෛද්‍ය, කළමනාකරණ, විද්‍යා හා කෘෂි විද්‍යා ශික්ෂණයන්ට අයත් පළමු වසර උපාධි අපේක්ෂකයන් 1138 ක් නියැදිය වශයෙන් යොදා ගැනිනි. මෙම අධ්‍යයනයේ දී ඉගෙනුම් ශෛලීන් හැඳින ගැනීම සඳහා යොදා ගන්නා ලද්දේ කොල්බ් ගේ සම්මත ප්‍රශ්නාවලියේ සිංහල පරිවර්තනයයි. මීට අමතරව සිසු ඉගෙනුම් ශෛලීන් කෙරෙහි පසුබිම් විය හැකි සාධක අනාවරණය කිරීම පිණිස තොරතුරු ලබා ගැනීමට කෙටි ප්‍රශ්නාවලියක් ද යොදා ගන්නා ලදී.

මෙම පර්යේෂණයේ දී වැදගත් කරුණු කිහිපයක් හෙළිදරව් විය.

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයේ කලා ශික්ෂණයේ සිසුන් සහ විවිධ විද්‍යා ශික්ෂණවල සිසුන් අතර ඉගෙනුම් ශෛලීන් ආශ්‍රිතව පැහැදිලි විභේදනයක් පවතින බව අනාවරණය විය. මෙය පැරණි ( හඩ්සන්ගේ) කලා /විද්‍යා, අපසාරී / අභිසාරී විභේදනය හා සමාන්තර වේ.

- කලා ශික්ෂණය හැර ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා, කළමනාකරණ හා කෘෂි විද්‍යා ශික්ෂණ තුළ උපාධි අපේක්ෂකයන්ගේ ඉගෙනුම් ශෛලි ව්‍යාප්තීන් වෙසෙසි ලෙස අසමානව ව්‍යාප්තව තිබුණි. ඉගෙනුම් ශෛලිවල දිසාව මෙම ශික්ෂණවල දී අභිසාරී දෙසට යොමු

විය. මෙම සොයා ගැනීම බටහිර රටවල විශ්වවිද්‍යාල හා ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අතර සමාන කමක් දක්වයි.

- පියාගේ රැකියාව, දෙමව්පිය අධ්‍යාපනය සිසු ඉගෙනුම් ශෛලීන් හැඩ ගැසීමේ දී පසුබිම් වන සාධක වශයෙන් හඳුනා ගැනිනි. ඉහළ මට්ටමේ රැකියාවක් කරන පියවරුන්ගේ දරුවන් අභිසාරී බවත්, පහළ මට්ටමේ රැකියා කරන පියවරුන්ගේ දරුවන් අපසාරී බවත් අනාවරණය විය. එසේම ඉහළ අධ්‍යාපනය ලත් දෙමව්පියන්ගේ දරුවන් අභිසාරී ඉගෙනුම්ශෛලියක් දරන බවත් හෙළි විය.

- කොල්බ්ගේ ප්‍රශ්නාවලිය භාවිතයෙන් සිසුන්ගේ ඉගෙනුම් ශෛලීන් අනාවරණය කිරීම සාර්ථක බව සොයා ගැනීමකි. සිසු ඉගෙනුම් ශෛලීන් හැඳින ගැනීම සඳහාකොල්බ්ගේ උපකරණය භාවිතා කිරීමට තවදුරටත් ඇති හැකියාව ඉන් හැඟවේ.